


# ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර රතු කුරුස කමිටුව

පසුබිම්

COMITE INTERNATIONAL GENEVE
ICRC




# අප ඉටු කරන සේවාවන්

1989 දී ශ්‍රී ලංකාවට පැමිණි ජාත්‍යන්තර රතු කුරුස කමිටුව, මුලදී ජනතා විමුක්ති පෙරමුණේ නැගිටීම නිසා ඇතිවූ, සහ පසුව ශ්‍රී ලංකා රජය සහ ද්‍රවිඩ ඊළාම් විමුක්ති කොටි සංවිධානය අතර පැවති සන්නද්ධ ගැටුමෙන් උද්ගතවූ මානුෂවාදී අවශ්‍යතාවන්ට ප්‍රතිචාර දක්වමින් සිය සේවාවන් ඉටුකරමින් සිටී. වර්තමානයේ ජාත්‍යන්තර රතු කුරුස කමිටුව කලින් පැවති ගැටුමෙන් පීඩාවට පත් ජනතාවගේ ඉතිරිව පවතින මානුෂවාදී අවශ්‍යතා ආමන්ත්‍රණය කෙරෙහි අවධානය යොමු කරයි.

ජාත්‍යන්තර රතු කුරුස කමිටුව, ශ්‍රී ලංකාවේ:

1. අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල්වල මනෝසමාජීය, ආර්ථික, නෛතික, සහ පරිපාලනමය අවශ්‍යතා ආමන්ත්‍රණය කරන දිස්ත්‍රික් ව්‍යාප්ත සහායක වැඩසටහනක් ක්‍රියාත්මක කරයි. එමෙන්ම ඔවුන්ගේ ප්‍රියාදරයන්ට අත් වූ ඉරණම සහ ඔව්හු කොහේ සිටිත්ද,යි යන ප්‍රශ්නවලට පිළිතුරු සපයන යාන්ත්‍රණයක් උදෙසා කතා කරයි.

2. අධිකරණ වෛද්‍ය ප්‍රජාවට සිය ධාරිතාව ශක්තිමත් කරගැනීමට තාක්ෂණ ආධාර සැපයීම සහ අධිකරණ වෛද්‍ය කාර්යයන්ට සම්බන්ධ ප්‍රතිපත්ති ගැටලු පිළිබඳ සංවාදයට දායකවීම මගින් සන්නද්ධ ගැටුම්, ස්වාභාවික හෝ තාක්ෂණ ආපදා හෝ සංක්‍රමණවලදී මියයන පුද්ගලයන්ගේ මෘතදේහ වෘත්තියමය ලෙස සහ ගෞරවාන්විත අයුරින් කළමනාකරණය පිණිස සහසුකම් සපයයි.

3. රැඳවියන් දිවිගෙවන තත්වයන් සහ ඔවුන්ට සලකන ආකාරය වැඩිදියුණු කිරීම පිණිස බලධාරීන්ට උපකාර කිරීම සඳහා රැඳවුම් ස්ථානවල චාරිකාවල නිරතවේ. මෙයට සෞඛ්‍ය සේවා ලබාගැනීමේ හැකියාව සහ නියමිත අධිකරණ යුක්ති විනිශ්චය ක්‍රියාවලිය සඳහා ඔවුන්ට ඇති අයිතිය ඇතුළත්වේ.

4. සන්නද්ධ හමුදා සාමාජිකයන්, ජාතික බලධාරීන්, විද්වතුන් සහ ආගමික කවයන් අතර ජාත්‍යන්තර මානුෂවාදී නීතිය ප්‍රවර්ධනය සහ ඒ පිළිබඳව ඇති දැනුම ප්‍රගුණ කරයි. එමෙන්ම සෙවීම, අත්අඩංගුවට ගැනීම, හා රඳවාගැනීමේ පටිපාටි පිළිබඳ අදාළ ජාත්‍යන්තර නීති ප්‍රමිති පිලිබඳව පොලිස් නිලධාරීන් උදෙසා පුහුණු වැඩසටහන් පවත්වයි.

5. ජාත්‍යන්තර රතු කුරුස සහ රතු අඩසඳ සම්මේලනය ඉටුකරන සේවාවන්හි කේන්ද්‍රය වන විශ්වීය මානුෂවාදී ප්‍රතිපත්ති ප්‍රවර්ධනය සඳහා ශ්‍රී ලංකා රතු කුරුස සමාජය දරන ප්‍රයත්නවලට ආධාර කරයි.




# අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල්වල අවශ්‍යතාවලට ප්‍රතිචාර දැක්වීම

ජාත්‍යන්තර රතු කුරුස කමිටුව සන්නද්ධ ගැටුම් සහ වෙනත් ප්‍රචණ්ඩ තත්වයන්, ආපදා හෝ සංක්‍රමණ නිසා තමන්ගේ ප්‍රියාදරයන් අතුරුදහන් වූ පවුල්වලට ඔවුන් සොයාගැනීම පිණිස උපකාර කරයි. 1983 සිට 2009 දක්වා ශ්‍රී ලංකාවේ සන්නද්ධ ගැටුම පැවති කාලය තුළ, තම ඥාතීන් අතුරුදහන්වූ පවුල්වලින් ඔවුන් සොයා ගැනීම පිණිස දළ වශයෙන් ඉල්ලීම් 35,000 ක් ජාත්‍යන්තර රතු කුරුස කමිටුව වෙත ලැබුණි. ජාත්‍යන්තර රතු කුරුස කමිටුව අදාල සිද්ධි ගැන එම පවුල් යාවත්කාලීන කරමින් ඔවුන් සමඟ සම්බන්ධතා පවත්වා ගෙන ඇත. නැතිවූ පුද්ගලයන් සොයාගැනීම පිණිස ලැබුණු ඉල්ලීම්වලින් 15,000 කට වැඩි සංඛ්‍යාවක් දැනට ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ ඉතිරිව පවතින අතර ඉන් සමහරක් 1990 දී පමණ ලැබුණු ඉල්ලීම්ය.

2014 සිට 2015 දක්වා, ජාත්‍යන්තර රතු කුරුස කමිටුව අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල්වල අවශ්‍යතා පිළිබඳව තක්සේරුවක් දීපව්‍යාප්තව සිදුකළේය. මෙහිදී සොයාගත් කරුණු මෙම අවශ්‍යතා ආමන්ත්‍රණය කළ හැකි ආකාරය පිළිබඳ නිර්දේශ සමගින් අදාළ බලධාරීන් වෙත ලබාදෙන ලද අතර, එයට තම ප්‍රියාදරයන්ට සිදුවූයේ කුමක්දැයි දැනගැනීමට මෙම පවුල්වලට ඇති අයිතියද ඇතුළත්විය. මෙම අරමුණ සඳහා ජාත්‍යන්තර රතු කුරුස කමිටුව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට නෛතික සහ අධිකරණ වෛද්‍ය විශේෂඥ ඥානය මෙන්ම දත්ත රැකවරණය සහ දත්ත කළමනාකරණය මාර්ගයෙන් තාක්ෂණ ආධාර සපයා ඇත. ශ්‍රී ලංකාවේ තවමත් අතුරුදහන්ව ඇති පුද්ගලයන් සම්බන්ධයෙන් මරණ සහතිකයට විකල්පයක් ලෙස “දක්නට නොමැති බවට වූ සහතිකයක්” හඳුන්වාදීමට ජාත්‍යන්තර රතු කුරුස කමිටුව බලධාරීන් සමඟ කටයුතු කළේය.

ජාත්‍යන්තර රතු කුරුස කමිටුව අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල්වලට උපකාර කිරීමට දේශීය සංවිධානවල සහයෝගය ඇතිව පුළුල් සහායක වැඩසටහනක් ආරම්භ කළේය. මෙම වැඩසටහනින් අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල්වලට ජීවනෝපාය හා මානසික සහනය සඳහා ආධාර කරන අතර ඔවුන් තම අතුරුදහන්වූ ඥාතීන් පිළිබඳ පිළිතුරු අපේක්ෂාවෙන් පසුවන කාලයේදී යොමුකිරීමේ ක්‍රමවේදයක් මාර්ගයෙන් ලිපිලේඛන කාර්යයන් උදෙසා පරිපාලන සහ නෛතික ආධාර සපයයි.

අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල්වලට අත්‍යවශ්‍ය අවශ්‍යතා සපුරාගැනීමට හා ආහාර පරිභෝජනය දියුණු කරගැනීමට හැකිවන පරිදි ජීවනෝපායන් ගොඩනගා ගැනීම හා තිරසාර ආදායමක් සකසාගැනීම පිණිස මුදල්, ද්‍රව්‍යමය සහ තාක්ෂණ වශයෙන් ආර්ථික ආධාර සපයනු ලැබේ.

ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ විවිධ ජීවනෝපාය ආධාර වැඩසටහන් මාර්ගයෙන්, පීඩාවන්ට පත්වීමේ අවදානමේ පසුවන මෙම පවුල් තම ව්‍යාපාර පුළුල්කර ගැනීමට ඉඩසලසා ගනිමින් ව්‍යාපාර කළමනාකරණ කුසලතා දියුණුකරගනිමින් වෙළෙඳපොල සහ සේවා සැපයුම්කරුවන් සමඟ සම්බන්ධතා ගොඩනගාගනිති.

අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල් දිවිගෙවන අවිනිශ්චිත තත්වය අර්ථනිරූපනය කෙරෙන්නේ ප්‍රියාදරයෙකු අහිමිවීමේ වටාපිටාවෙහි තොරතුරු නොමැතිවීම වශයෙනි. මෙම අත්දැකීම "අවිනිශ්චිත අහිමිවීම" ලෙස හැඳින්වේ. අවිනිශ්චිත අහිමිවීම යන සංකල්පය ගැන දැනුම වර්ධනය කිරීම පිණිස ජාත්‍යන්තර රතු කුරුස කමිටුව වැඩමුළු පැවැත්වීමට අමතරව විශ්ව විද්‍යාලවලදී දේශන සංවිධානය කරන අතර එහි අරමුණවන්නේ එය මනෝ විද්‍යා සහ උපදේශන විෂයමාලාවට එක්කිරීමයි.




## අධිකරණ වෛද්‍ය ධාරිතාව ශක්තිමත් කිරීම

ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ අධිකරණ වෛද්‍ය වැඩසටහන සන්නද්ධ ගැටුම්, ස්වාභාවික හෝ තාක්ෂණ ආපදා හෝ සංක්‍රමණවලදී මියයන පුද්ගලයන්ගේ මෘතදේහ ගෞරවාන්විතව සහ වෘත්තිය තත්වයෙන් මෙහෙයවීම සහතික කිරීමට ක්‍රියාකරයි.

ශ්‍රී ලංකාවේදී ජාත්‍යන්තර රතු කුරුස කමිටුව අධිකරණ වෛද්‍ය ප්‍රජාවට මෘතදේහ සොයාගැනීමේ, පරීක්ෂණ සිදුකිරීමේ සහ හඳුනාගැනීමේ ධාරිතාවන් ශක්තිමත් කිරීමට මෙන්ම අධිකරණ වෛද්‍ය පුරාවිද්‍යාව සහ මානව විද්‍යාව භාවිතයට ආධාර සපයයි. මෙයට ක්‍රමවත් රාමුවක් ඇතුළත අධිකරණ වෛද්‍ය විද්‍යාව ආශ්‍රිත දත්ත රැස්කිරීම, මධ්‍යගත කිරීම සහ කළමනාකරණය පිණිස තාක්ෂණ විශේෂඥඥානය ශක්තිමත් කිරීමද ඇතුළත්වෙයි.

ජාතික පාර්ශවකරුවන් සමග එක්ව ක්‍රියාකරමින්, ජාත්‍යන්තර රතු කුරුස කමිටුව වෘත්තිය ආරක්ෂක ක්‍රියාමාර්ග පුළුල් කිරීමට මෘතශරීරාගාර ඇතුළත ආසාදන නිවාරණ පාලනය ආමන්ත්‍රණය පිණිස කුඩාපරිමාණ යටිතළ පහසුකම් දියුණු කිරීමට ආධාර සපයයි. කෝවිඩ්-19 වසංගතයේදී, ජාත්‍යන්තර රතු කුරුස කමිටුව පුද්ගල ආරක්ෂණ උපකරණ සහ මළසිරුරු බහාලන බෑග සපයමින් මෘතශරීරාගාරවලට සහ සෞඛ්‍ය අමාත්‍යාංශයට උපකාර කළේය.

ජාත්‍යන්තර රතු කුරුස කමිටුව දැනුම වර්ධනය කිරීම, අදහස් හුවමාරුකරගැනීම සහ ආසියා පැසිෆික් කලාපයේ වෘත්තියවේදීන් ගේ ජාලවලට පහසුකම් සැලසීමේ අරමුණින් මානුෂවාදී අධිකරණ වෛද්‍ය විද්‍යාව පිළිබඳ ජාතික සහ ජාත්‍යන්තර වැඩමුළු සහ සම්මන්ත්‍රණ සංවිධානය කරයි.




# තම නිදහස අහිමි පුද්ගලයන්ට සැලකීම සහ ජීවන තත්වය වැඩිදියුණු කිරීමට උපකාර කිරීම

1983 සිට ශ්‍රී ලංකාවේදී, ජාත්‍යන්තර රතු කුරුස කමිටුව සන්නද්ධ ගැටුම් සහ වෙනත් ප්‍රචණ්ඩ තත්වයන් සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන සිටින පුද්ගලයන් මුනගැසීමේ චාරිකාවල යෙදෙයි. වර්තමානයේ ජාත්‍යන්තර රතු කුරුස කමිටුව තම නිදහස අහිමි පුද්ගලයන්ට සැලකීම, ජීවන තත්වයන් සහ පවතින නීතියේ රැකවරණයට ගරුකිරීම වැඩිදියුණු කිරීමට බලධාරීන්ට උපකාර කිරීමට බන්ධනාගාර, සංක්‍රමණික රැඳවුම් මධ්‍යස්ථාන සහ පොලිස් ස්ථාන ඇතුළු රැඳවුම් ස්ථානවල චාරිකාවල යෙදෙයි.

ජාත්‍යන්තර රතු කුරුස කමිටුව යෙදෙන චාරිකාවලදී සොයාගන්නා කරුණු සහ නිර්දේශ බන්ධනාගාර තදබදයට අදාළ නෛතික සහ අධිකරණ හේතු, ජීවන තත්වයන් වැඩිදියුණු කිරීම සහ තම නිදහස අහිමි පුද්ගලයන්ට මානුෂවාදීව සැලකීම වැනි ගැටලු ආමන්ත්‍රණය කිරීමට රැඳවුම් බලධාරීන් දරන ප්‍රයත්නවලට ආධාර කිරීමේ අරමුණින් රැඳවුම් බලධාරීන් සමඟ පමණක් බෙදාගැනේ. රතු කුරුස පණිවුඩ හුවමාරුව සහ රැඳවුම්භාරයේ පසුවන තම ප්‍රියාදරයන් හමුවීමට යාම පිණිස ගමන් වියදම් දීමනාවක් එම පවුල්වලට ලබාදීම මගින් ජාත්‍යන්තර රතු කුරුස කමිටුව රැඳවියන්ට තම පවුල් සමග සම්බන්ධතා පවත්වාගෙනයාමට උපකාර කරයි.

බන්ධනාගාරවල කුඩාපරිමාණ යටිතළ පහසුකම් ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ජාත්‍යන්තර රතු කුරුස කමිටුව බන්ධනාගාරවල සෞඛ්‍ය ආරක්ෂණ සේවාවන් වැඩිදියුණු කිරීමට බලධාරීන් සමඟ ක්‍රියා කරයි. කෝවිඩ්-19 වසංගත කාලයේදී ජාත්‍යන්තර රතු කුරුස කමිටුව තාක්ෂණ නිර්දේශ සහ ද්‍රව්‍යමය ආධාර ලබාදෙමින් රැඳවුම් ස්ථානවල වෛරසය පැතිරයාම පාලනය කිරීමට රැඳවුම් අධිකාරීන්ට සහාය දැක්විය. බන්ධනාගාර රැඳවියන්ට තම ප්‍රියාදරයන් සමඟ සම්බන්ධවීම පිණිස උපකාර කිරීමක් ලෙස බන්ධනාගාර දෙපාර්තමේන්තුව ආරම්භ කළ වීඩියෝ චාරිකා පහසුකම් සැලසීමටද ජාත්‍යන්තර රතු කුරුස කමිටුව ආධාර සැපයීය.

ජාත්‍යන්තර රතු කුරුස කමිටුව රැඳවුම් බලධාරීන්ගේ තාක්ෂණික ධාරිතාව ගොඩනැංවීමේ අරමුණින් හා ප්‍රශස්ත භාවිත ක්‍රම හුවමාරු කරගැනීමට හැකිවන අයුරින් රැඳවුම් සම්මතයන් පිළිබඳව දේශීය වශයෙන් වැඩමුළු සහ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සංවිධානය කරයි.




# ජාත්‍යන්තර මානුෂවාදී නීතියට ගරුකිරීම ප්‍රවර්ධනය කිරීම

සන්නද්ධ ගැටුම් සහ වෙනත් ප්‍රචණ්ඩ තත්වයන්හිදී සිදුවන දුක්පීඩා සහ හානි අඩුකිරීම පිණිස ගෝලීය වශයෙන් අප දරන වෑයමේ කොටසක් ලෙස, අපි සන්නද්ධ සහ ආරක්ෂක හමුදා, ජාතික බලධාරීන්, සිවිල් සමාජය සහ විද්වතුන් අතර ජාත්‍යන්තර මානුෂවාදී නීතිය සහ ජාත්‍යන්තර මානව අයිතිවාසිකම් නීතියේ අදාළ අංශ පිළිබඳ දැනුම ප්‍රගුණ කිරීමට සහ තහවුරු කිරීම පිණිස ක්‍රියා කරමු.

අපි මෙම ආයතනවලට ඔවුන්ගේ පුහුණු වැඩසටහන්වලට සහ විෂයමාලාවන්ට ජාත්‍යන්තර මානුෂවාදී නීතියේ මූලධර්ම ඒකාබද්ධ කිරීමට උදවි කරන අතර මෙම විෂය පිළිබඳව පවතින අවබෝධය වර්ධනය කරගැනීම පිණිස විදේශයන්හිදී පැවැත්වෙන ජාත්‍යන්තර මානුෂවාදී නීතිය පිළිබඳ සම්මන්ත්‍රණ, වැඩමුළු සහ සමුළුවලට ඔවුන්ගේ සහභාගිත්වය සඳහා අනුග්‍රහය දක්වමු. ජාත්‍යන්තර මානුෂවාදී නීතියේ මූලධර්ම සහ විද්වතුන් ගේ අදාළ ආගම් අතර අනුරූපතාව ගවේශනය කිරීම පිණිසද අපි විවිධ ඇදහිම්වල විද්වතුන් සමඟ කටයුතු කරමු.

එක්සත් ජාතීන් ගේ සාම සාධක මෙහෙයුම්වල දායකයෙකු වශයෙන් ශ්‍රී ලංකාවේ භූමිකාව පෙරදැරි කරගෙන, අපි විදේශයන්හි සාම සාධක මෙහෙවරවල යොදවන සන්නද්ධ හමුදා සාමාජිකයන්ට ජාත්‍යන්තර මානුෂවාදී නීතිය සහ ජාත්‍යන්තර මානව අයිතිවාසිකම් නීතිය පිළිබඳ දැනුවත් කිරීම් පවත්වමු. ජාත්‍යන්තර මානුෂවාදී නීතිය සහ මුහුදු සන්නද්ධ ගැටුම්වලට අදාළ නීතිය ප්‍රවර්ධනය කිරීමට ශ්‍රී ලංකා නාවික හමුදාව සමඟ ක්‍රියාකරන අපි, මුහුදේදී පැනනගින මානුෂවාදී ගැටලු සම්බන්ධ ඔවුන්ගේ ධාරිතාව ගොඩනැංවීමටද සහාය වෙමු. ත්‍රස්ත විමර්ශන කොට්ඨාසය, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සහ පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය ඇතුළු ශ්‍රී ලංකා පොලිසියේ කොට්ඨාස ගණනාවකට ජාත්‍යන්තර මානුෂවාදී නීතිය, බලය සහ ගිනිඅවි නිවැරැදි භාවිතය, සහ සෝදිසි කිරීම්, අල්ලාගැනීම, අත්අඩංගුවට ගැනීම සහ රැඳවා ගැනීමේ පටිපාටි පිළිබඳවද අපි පුහුණුව සපයමු.

ජාත්‍යන්තර මානුෂවාදී නීතිය පිළිබඳ අපගේ උපදේශක සේවාව මාර්ගයෙන් අපි ජාත්‍යන්තර මානුෂවාදී නීතිය ජාතික වශයෙන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ජාතික බලධාරීන්ට තාක්ෂණ සහාය සපයන අතර ජාත්‍යන්තර මානුෂවාදී නීතිය හා සබැඳි ජාත්‍යන්තර සම්මුති සමඟ අනුබැඳුම පිණිස උපදේශනය කරමු.

ජාත්‍යන්තර මානුෂවාදී නීතියේ ප්‍රායෝගික භාවිතය පිළිබඳ අවබෝධයක් ලබාගැනීමට නීති උපාධි අපේක්ෂයන්ට අවස්ථාවක් ලබාදීම පිණිස, ජාත්‍යන්තර අපරාධ උසාවියක වටාපිටාවකදී ජාත්‍යන්තර මානුෂවාදී නීතියේ ප්‍රායෝගික භාවිතය පරීක්ෂා කරමින් අපි වාර්ෂිකව ජාතික වාද උසාවි තරඟයක් සංවිධානය කරමු.




# ශ්‍රී ලංකා රතු කුරුස සමාජය සමඟ සහයෝගයෙන් වැඩකිරීම

ශ්‍රී ලංකා රතු කුරුස සමාජය සමඟ සමීප සහයෝගයෙන් වැඩ කරන ජාත්‍යන්තර රතු කුරුස කමිටුව එහි මානුෂවාදී සේවා ඉටුකිරීම පිණිස මූල්‍ය, තාක්ෂණ සහ ද්‍රව්‍යමය ආධාර සපයයි. කලින් පැවති ගැටුම, ස්වාභාවික ආපදා හෝ සංක්‍රමණ නිසා පවුල්වලින් වෙන්වූ පුද්ගලයන් සහ ඔවුන්ගේ පවුල් අතර යළි සම්බන්ධතා ඇති කිරීම මෙන්ම ජාත්‍යන්තර රතු කුරුස සහ රතු අඩසඳ සම්මේලනයේ මූලික ප්‍රතිපත්ති පිළිබඳ අවබෝධය පුළුල් කිරීම සහ ප්‍රචාරණය ඊට අයත්වෙයි.

හදිසි අවස්ථා සඳහා පෙරසූදානම හා ප්‍රතිචාරය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රතු කුරුස සමාජයේ ධාරිතාව සංවර්ධනය සඳහා එම සමාජය සමඟ කටයුතු කරන ජාත්‍යන්තර රතු කුරුස කමිටුව එහි ප්‍රථමාධාර වැඩසටහනට ද ආධාර සපයයි.

විවිධ පරිසරයන් තුළ සුරක්ෂිත සහ කාර්යක්ෂම ලෙස මානුෂවාදී අවශ්‍යතාවලට ප්‍රතිචාර දැක්වීම පිණිස ධාරිතාවන් ඉහළනංවා ගැනීමට ජාතික සමාජවලට ආධාර කිරීමේ රාමුවක් වන සුරක්ෂිත ප්‍රවේශය (Safer Access) වැඩසටහනින් ජාත්‍යන්තර රතු කුරුස කමිටුව ශ්‍රී ලංකා රතු කුරුස සමාජයට පුහුණුව සපයයි.

කෝවිඩ්-19 වසංගතයේ බලපෑම නිසා පීඩාවට පත්වීමේ අවදානමෙහි පසුවන ජනතාවට හදිසි සහනාධාර ලබාදීමට ජාත්‍යන්තර රතු කුරුස කමිටුව ශ්‍රී ලංකා රතු කුරුස සමාජය සමඟ හවුලේ කටයුතු කළේය. කෝවිඩ්-19 පැතිරීමේ අවදානම අඩුකිරීමට හේතුවන ලෙස ජනතාව දැනුවත් කිරීමේ සහ පොදු ස්ථානවල විෂබීජහරණ ව්‍යාපාර ක්‍රියාත්මක කිරීමට ද අපි ශ්‍රී ලංකා රතු කුරුස සමාජයට මූල්‍ය, තාක්ෂණ සහ ද්‍රව්‍යමය ආධාර ලබාදුනිමු.

ලොවපුරා සන්නද්ධ ගැටුම් සහ වෙනත් ප්‍රචණ්ඩ තත්වයන් නිසා පීඩාවට පත් ජනතාවට ගරුත්වය රැකගැනීමට සහ ඔවුන්ගේ දුක්පීඩා සමනය කරගැනීම පිණිස ජාත්‍යන්තර රතු කුරුස කමිටුව, රතු කුරුස සහ රතු අඩසඳ හවුල්කරුවන් සමඟ එක්ව නිතරම හැකි සෑම දෙයක්ම ඉටුකරමින් උපකාර කරයි. ජාත්‍යන්තර මානුෂවාදී නීතිය ප්‍රවර්ධනය කරමින් හා ශක්තිමත් කරමින් සහ විශ්වීය මානුෂවාදී ප්‍රතිපත්ති ප්‍රචාරණය කරමින් මෙම සංවිධානය පීඩාවන් වැලැක්වීමට උත්සාහ කරයි.

facebook.com/icrc
twitter.com/icrc
instagram.com/icrc

**ජාත්‍යන්තර රතු කුරුස කමිටුව**
29, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 05
ශ්‍රී ලංකාව
දුරකථන: +94 (11) 250 33 46
ෆැක්ස්: +94 (11) 250 33 48
ඊ මේල් : colombo@icrc.org
වෙබ්: www.icrc.org

**වව්නියාව කාර්යාලය**
70, වයිරවර් කෝවිල පාර,
වයිරවර්පුලියන්කුලම්, වව්නියාව
දුරකථන: +94 (0)24 222 28 55
ෆැක්ස්: +94 (0)24 222 25 37

**මඩකලපුව කාර්යාලය**
මන්රීසා පාර,කොතුකුලම්,
පිල්ලයාරඩි මඩකලපුව
දුරකථන: +94 (0)65 222 70 70

ICRC

© ICRC, September 2021

1663/259 09.2021 2000 පිටකවර ඡායාරූපය: ICRC